***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) රාජ්‍ය සංස්ථාවක් විසින් දත්ත සකස් කිරීම සිදු කරන අවස්ථාවක දී දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කිරීම හෝ පත් කිරීම පිළිබඳ අවශ්‍යතාවය බැහැර කිරීම සම්බන්ධයෙන්; සහ

(ආ) පාලකවරයා විසින් හෝ දත්ත සකසන්නා විසින් සිදු කරනු ලබන ප්‍රධාන දත්ත සැකසීමේ ක්‍රියාකාරකම්, දත්ත දායකයාගේ අයිතිවාසිකම්වලට බලපෑම් කරනු ලබන හානියක් පිළිබඳ අවදානමක් සහිත දත්ත සැකසුම් ප්‍රභේදවලින් සංයුක්ත වන අවස්ථාවක දී, දත්ත ආරක්ෂණ නිලධරයකු පත් කිරීම හෝ නම් කිරීම සඳහා නියම කරමින්,

විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අධිකාරියේ ලිඛිත ඉල්ලීමක් මත පමණක් පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම් ඇගැයීමක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සහතික කරන ලද, දත්ත දායකයන්ගේ, අයිතිවාසිකම්වලට හානියක් වීමේ අවදානම සම්බන්ධයෙන් එම වගන්තිය අදාළ වීම සීමා කිරීම වේ; සහ

(ආ) එම වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්ති ඉවත් කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජනය කරන ලද එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, දේශසීමා හරහා පෞද්ගලික දත්ත සංචලනය කිරීමේ යෙදී සිටින පාලකවරයකු විසින් හෝ දත්ත සකසන්නකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු නියමයන් නිශ්චිතව දැක්වීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා අධිකාරියට හැකියාව ලබා දෙමින් ප්‍රධාන ප්‍රඥප්තියට 51අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලැබේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 10 වන වගන්තිය සහ 13 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් "දත්ත ආරක්ෂණ නිලධරයා", "පොදු අධිකාරය" සහ "තෙවන රට" යන යෙදුම්වල අර්ථ නිරූපණ ප්‍රතියෝජනය කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් අධිකාරියේ සභාපතිවරයා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීම සඳහා හැකියාව ලබාදෙමින් ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

